# ඡේද අභ්‍යාස

- **ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1) ක්ලැරිබෙල්, කහ පාට කැනේරි වර්ගයට අයත් කුඩා පක්ෂියෙක්, ඈ අහසේ රැඳී සිටියේ පිහාටුත් හකුළාගෙනයි. පුදුමයෙන් මා ඈ දෙස බලා සිටිද්දී ම ඈ කාමරයෙන් පිටතට ගියේ පෘථිවියේ කිසිම පක්ෂියකු නොකරන ආකාරයට පසු පසට පියෑඹීමෙනුයි. ගුරුත්වය රහිත තත්ත්වයට ඈ ඉතා හොඳින් හැඩගැසී ඇති බව මේ නිසා මට පෙනුණා.

1. ක්ලැරිබෙල් කුමන වර්ගයට අයත් පක්ෂියෙක් ද?

   ...........................................................................................................................

2. ක්ලැරිබෙල් අහසේ රැඳී සිටීමේ දී දැක් වූ විශේෂ හැකියාව කුමක් ද?

   ...........................................................................................................................

3. පෘථිවියේ කිසිම පක්ෂියෙකු නොකරන නමුත් මෙහි දී ක්ලැරිබෙල්ට කළ හැකි වූ දේ කුමක් ද?

   ...........................................................................................................................

4. මෙහි සඳහන්ව ඇති 'සහිත' යන්නට විරුද්ධාර්ථය ඇති පදය කුමක් ද?

   ...........................................................................................................................

5. ක්ලැරිබෙල් ඉතා හොඳින් හැඩ ගැසී තිබුණේ කුමකට ද?

   ...........................................................................................................................

6. කුරුල්ලෙක් යන පදය වෙනුවට මෙහි යොදා ඇති පදය ලියන්න.

   ...........................................................................................................................

2) ලුයී තම මවගේ ගෙදර දොරේ වැඩ කටයුතුවලට උදවු පදවු කළේ ය. සෑම සැඳෑවක ම ලුයී රාත්‍රී කෑම මේසය සකසන්නට මවට උදවු වූයේ ය. ඔහු පිඟන් කෝප්ප හැඳි ගෑරුප්පු ආදිය නිසි තැන පිළිවෙළට තැබුවේ ය. සෑම උදෑසනක ම ලුයී බීමට වතුර ගෙන ඒමට ළිඳට ගියේ ය. වතුර පිරුණු බරැති පනිට්ටුවත් රැගෙන කුඩා කඳු ගැට සහිත පටු පාරෙහි එන විට ලුයී බිම පෙරළී වතුර පනිට්ටුව ද ඉහිරී ගිය අවස්ථා බොහෝ ය.

1. මෙහි සඳහන් දරුවාගේ නම කුමක් ද?

   ...........................................................................................................................

2. සෑම උදෑසනක ම ඔහු කරන්නේ කුමක් ද?

   ...........................................................................................................................

3. මෙහි සඳහන් යුගල පදයක් ලියන්න.

   ...........................................................................................................................

4. ඔහු දිය ගෙන ඒමට ගියේ කුමන පාරක ද?

   ...........................................................................................................................

5. "ලුයි තම මවගේ ගෙදර දොරේ වැඩවලට උදවු පදවු කළේ ය." මෙම වාක්‍යය වර්තමාන කාලයට හරවා ලියන්න.

.................................................................................................................

6. නියමිත, සුදුසු, ගැළපෙන යන වචනවල අදහසට සමාන අර්ථයක් දෙන වචනයක් ඡේදයේ සඳහන් වේ. ඒ කුමක් ද?

.................................................................................................................

3) නංගී උදේ පාන්දරින් ම නැගිටියි. ඈ කළුවරේ ම දුවන්නේ දිවුල් ගස් යටට ය. ඈ හැම තැන ම එබිකම් කර දිවුල් අහුලයි. නංගී ඒවා ගෙනෙන්නේ හපන්කමක් කළාක් මෙනි. ඈ ඒවා ළඟ තබා ලොකු කුඩා බලයි. ඈ පළමුව එකක් දෙන්නේ මට ය. එය කන්නේ ඈත් මාත් හවුලේ ය.

1. නංගී පාන්දරින් ම දුවන්නේ කොතැනට ද?

.................................................................................................................

2. දිවුල් ළඟ තබා ගෙන ඇය කරන්නේ කුමක් ද?

.................................................................................................................

3. නංගීත් මමත් දිවුල් කන්නේ කෙසේ ද?

.................................................................................................................

4. මෙහි සඳහන් ස්ථාන නාම පදයක් ලියන්න.

.................................................................................................................

5. මූර්ධජ අකුරකින් පටන් ගන්නා වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

.................................................................................................................

6. මෙහි සඳහන් උපමාවක් ලියන්න.

.................................................................................................................

4) සොබාදහම හා මිනිසා අතර ඇති අපූරු බැඳීම පිළිබඳ විශිෂ්ට අදහස් දැරූ නායකයෝ ලොව සිටියහ. ශ්‍රේෂ්ඨ රතු ඉන්දීය නායක සියැටල්ගේ නාමය අදත් අපට සිහිපත් වනුයේ ඔහුගේ ඒ අදහස් හා ආකල්ප නිසා ම ය. සොබාදහම පිළිබඳ ඔහුගේ ගෞරවය සහ ආදරය ඒ අදහස්වලින් ප්‍රකට වේ. එවක ඇමෙරිකානු ජනාධිපතිතුමා වූ ජැක්ලින් පියස්, රතු ඉන්දීයයන්ගේ භූමිය ඇමෙරිකානු රජයට විකුණන ලෙස ඉල්ලීමක් කළේ ය. ඊට පිළිතුරු වශයෙන් ක්‍රිස්තු වර්ෂ 1854 මාර්තු 04 වැනි දින සියැටල් කළ විශේෂ ප්‍රකාශයෙන් උපුටා ගත් අදහස් කිහිපයක් මේ පාඩමට ඇතුළත් වේ.

1. මෙහි විස්තර කෙරෙන අපූරු බැඳීම පැවතියේ කා අතර ද?

.................................................................................................................

2. සියැටල්ගේ අදහස්වලින් ප්‍රකට වන්නේ කුමක් ද?

.................................................................................................................

3. මෙහි සඳහන් ඇමෙරිකානු ජනාධිපතිවරයාගේ නම කුමක් ද?

.................................................................................................

4. ඔහුගේ ඉල්ලීම වූයේ කුමක් ද?

.................................................................................................

5. තාලුජ "ශ" යෙදුණු වචන දෙකක් ඡේදයෙන් ම සොයා ලියන්න.

.................................................................................................

6. මූර්ධජ අකුරක් හා සඤ්ඤක අකුරක් යෙදුණු වචනය තෝරා ලියන්න.

.................................................................................................

5) මේ ආච්චිට ආදරය කරන දරුවෝ සිය උපන් දිනවල දී කුඩා කේක් කෑල්ලක් ඉතුරු කර ගෙනැවිත් දෙති. දරුවන් ගැන සිතන මේ ආච්චි අම්මා ද කිසිදාක නිවාඩුවක් නොගනියි.

"හිසේ ඇම්මක්, උණක් හෙම්බිරිස්සාවක් හැදුණත් කොත්තමල්ලි ටිකක් තම්බාගෙන බීලා මම වෙලාවට වැඩට එනවා. දරුවෝ මං එනතුරු බලාගෙන ඉන්නවා." ඇයගේ කැපවීම පුදුමාකාර ය!

1. දරුවන් කේක් ගෙනැවිත් දෙන්නේ කාට ද?

.................................................................................................

2. මෙහි සඳහන් ආකාරයට උණ හෙම්බිරිස්සාවට සුදුසු ප්‍රතිකාරය කුමක් ද?

.................................................................................................

3. "මම වෙලාවට වැඩට එනවා" යන කියමනෙන් ඇය තුළ තිබූ කුමන ගුණයක් ප්‍රකාශ වේ ද? .................................................................................

4. අසනීප තිබියදීත් වැඩට පැමිණීමට ඇය පොළඹවන හේතුව ලෙස මෙහි සඳහන් වන්නේ කුමක් ද?

.................................................................................................

5. "හිසේ ඇම්ම" මෙයින් අදහස් කළේ කුමක් ද?

.................................................................................................

6. "දරුවෝ මං එනතුරු බලාගෙන ඉන්නවා" මේ වාක්‍යය ලියන බසට හරවා ලියන්න.

.................................................................................................

6) මා කියන මේ වෙදා නම් ලෝකයෙහි ඇති තාක් වෙදුන් අතරින් ප්‍රධානයා යැ. එහෙත් ඔහුගෙන් වෙදකම් ගැනීම තරම් පහසු වූ කර්යයෙක් වෙන නැති. වෙන වෙදුන් කැඳවා ගෙනැ ඒමට නම්, යම් කිසිවකු යා යුතුයි; රථයක් ගෙනැ යා යුතුයි. පඬුරු ගෙනැ යා යුතුයි. මේ මහ වෙදා කැඳවා ගෙනැ ඒමට යෑම නුවුවමනා යැ. ඔහුට රථ නුවුවමනා යැ. ඔහුට පඬුරු නුවුවමනා යැ. කැඳැවීමක් නැති වැ හේ තෙමේ මැ එයි.

1. අනිත් වෙදුන් අතර මෙහි සඳහන් වෙදාට ඇති තැන කුමක් ද?

.................................................................................................

2. මේ වෙදාගෙන් වෙදකම් ගැනීම පිළිබඳ ව මෙහි විශේෂයෙන් සඳහන් වන්නේ කුමක් ද?

.......................................................................................................................

3. මෙහි කියැවෙන වෙදා තුළ අනෙක් වෙදුන්ට වඩා ඇති වෙනස්කමක් ලියන්න.

.......................................................................................................................

4. 'නුවුවමනා' යන්නට විරුද්ධ පදය ලියන්න.

...............................................................

5. ඝඤ්ඤක අකුරු යෙදුණු වචන දෙකක් ලියන්න.

.......................................................................................................................

6. 'වෙදා' යන්නට සමාන පදයක් ලියන්න.

.....................................................................

7) සීයා පබළු ඇට දෙක තුනක් බිම දැම්මා. වැඩේ ලේසි වුණේ නැහැ. අහුලන්න අමාරුයි. ඊළඟට සීයා කිවුවේ හැරමිටිය අල්ලා ගන්න. මහපටැඟිල්ල නැතුව අල්ලලා අදින්න කියලා. ඒ වැඩෙත් හරියට කරන්න ආමාරුයි. වැඩි බලයක් යොදන්න බැහැ. සීයා කෝටුවක් දීලා වැල්ලේ ලියන්න කිවුවා. බලන කොට ඒ වැඩෙත් මහපටැඟිල්ල නැතිව කරගන්න අමාරුයි.

1. සීයා බිමට දැම්මේ මොනවා ද?

.......................................................................................................................

2. සීයා හැරමිටිය අල්ලාගෙන අදින්න කීවේ කෙසේ ද?

.......................................................................................................................

3. සීයා නියම කළ සියලු වැඩ කර ගැනීමට උදව් අවශ්‍ය වන්නේ කාගේ ද?

.......................................................................................................................

4. 'පබළු ඇට' මෙයට ඒක වචන පදය ලියන්න.

.......................................................................................................................

5. 'අමාරුයි' යන්නට සමාන පදයක් ලියන්න.

.......................................................................................................................

6. 'ලේසි' යන පදය යොදා ගෙන යුගල පදයක් ලියන්න.

.......................................................................................................................

8) භාෂා හැකියාව මිනිසාට හිමි වූ සුවිශේෂ දායාදයකි. භාෂා භාවිතයෙන් අදහස් රසවත් ලෙස ප්‍රකාශ කළ හැකි ය. පොතපත කියවීමෙන් හා එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීමෙන් අප දන්නා වචන ප්‍රමාණය හෙවත් වාක්කෝෂය වඩාත් වර්ධනය කරගත හැකි ය. අපේ අදහස් වඩාත් රසවත් ලෙස ඉදිරිපත් කළ හැක්කේ ඒ වචනවල අර්ථය

හෙඳින් අවබෝධ කර ගැනීමෙනි. මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා ලියා ඇති මේ ලිපිය කියවමු. එය සකස් කර ඇත්තේ එතුමාගේ **කිව්වම මොකද** ග්‍රන්ථය ඇසුරෙනි.

1. මිනිසාට හිමි වූ සුවිශේෂ දායාදය කුමක් ද?

   ..........................................................................................................................

2. අප දන්නා වචන ප්‍රමාණය හෙවත් වාක්කෝෂය වඩාත් වර්ධනය කර ගත හැක්කේ කෙසේ ද? ..........................................................................................................

3. අපේ අදහස් වඩාත් රසවත් ලෙස ඉදිරිපත් කළ හැක්කේ කෙසේ ද?

   ..........................................................................................................................

4. මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා විසින් රචනා කර ඇති ග්‍රන්ථය නම් කරන්න.

   ..........................................................................................................................

5. ඡේදයේ සඳහන් මහාප්‍රාණ අකුර යෙදුණු වචන දෙකක් සොයා ලියන්න.

   ..........................................................................................................................

6. මෙහි සඳහන් යුගල පදයක් සොයා ලියන්න.

   ..........................................................................................................................

9) විශාල සහ සමෘද්ධිමත් වනරාජධානියක් වූ ඔලොන්ගෝහි තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වූයේ කබ්බු සුදු පරෙවියායි. කබ්බු සහ විසිඑක් දෙනකුගෙන් සමන්විත ඔහුගේ පරෙවි කණ්ඩායම ලිපි, පාර්සල්, මුදල් ඇණවුම් සහ තැපැල් ඇණවුම් ආදිය රැගෙන ඔලොන්ගෝ කැලෑවේ සිට අනිත් කැලෑවලට ගෙන ගොස් බෙදා දීමේ තැපැල් සේවාවේ නිරත වූහ. ඔවුන්ගේ කණ්ඩායම ඉතා ම කාර්යක්ෂම, ඉතා ම වේගවත් අපූරු ම කණ්ඩායමක් බවට මුළු වන රාජධානියේ ම පිළිගැනීමක් තිබිණ. ඒ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂම සහ ගුණාත්මක සේවාව වෙනුවෙන් සම්මාන රාශියක් ද පිරිනැමිණි.

1. මෙහි සඳහන් වනරාජධානියේ නම කුමක් ද?

   ..........................................................................................................................

2. කබ්බු සුදු පරෙවියා ප්‍රධානියා වූයේ කොහේ ද?

   ..........................................................................................................................

3. ඔහුගේ කණ්ඩායම තැපැල් සේවාවේ නිරත වූයේ මොනවා රැගෙන ද?

   ..........................................................................................................................

4. ඔවුන්ගේ කණ්ඩායම මුළු වනරාජධානියේ ම පිළිගැනීමක් ලබා තිබුණේ කෙසේ ද?

   ..........................................................................................................................

5. ඔවුන්ගේ කණ්ඩායමට සම්මාන රාශියක් පිරිනැමුණේ ඇයි?

   ..........................................................................................................................

6. මූර්ධජ අකුරු යෙදුණු වචන දෙකක් ඡේදයෙන් සොයා ලියන්න.

   ..........................................................................................................................

10)වර්තමානයේ අපගේ ලෝකය පිළිබඳ දැනුම මීට වඩා බොහෝ ඉදිරියෙන් ඇත. අප ජීවත් වන පෘථිවිය පමණක් නො ව අනෙකුත් ග්‍රහලෝක ගැන ද බොහෝ තතු අපි දනිමු. පොතපත, අන්තර්ජාලය භාවිතයෙන් අපට ඒ තොරතුරු දැන ගැනීමට ද හැකි ය. ඒ දැනුම දිනෙන් දින අලුත් වන්නේ ලෝකය පිළිබඳ තවදුරටත් විමසා බලන මිනිසුන් නිසා ය.

1. පෙරට වඩා දැනුම බොහෝ ඉදිරියෙන් ඇත්තේ කුමක් පිළිබඳව ද?

.....................................................................................................................

2. අනෙකුත් ග්‍රහලෝක ගැන තතු අපට දැනගත හැක්කේ කෙසේ ද?

.....................................................................................................................

3. ඡේදයේ සඳහන් සමාන පද යුගලයක් සොයා ලියන්න.

.....................................................................................................................

4. පැරණි යන්නට විරුද්ධ පදය ඡේදයෙන් සොයා ලියන්න.

.....................................................................................................................

5. මහාප්‍රාණ අකුරක් සහිත වචනයක් ලියන්න.

.....................................................................................................................

6. 'තතු' යන පදයේ අදහස ලියන්න.

.....................................................................................................................

11)ඇගේ ගම ගිංතොට ය. එය ගාලුපුරවරයට ඉතා ම කිට්ටු සුන්දර ගම්මානයකි. මල්, පලතුරු, ගහකොළවලින් පිරුණු නිරත ම සිසිල් සුළඟ මේ ගම ගැන අපූරු මතක සටහන් ඇයගේ සිහිනවල තිබිණි. හිමිදිරියේ ම අවදි වී ගේ අවට සිරියාව අත්විඳිමින් මේ පුංචි දැරිය ඒ අමුතු ම සිහින සිතින් මවා ගත්තා ය.

1. ඇගේ සිහිනවල මතක සටහනේ තිබූ ගම ලියන්න.

.....................................................................................................................

2. ගේ අවට සිරියාව ඇය වින්දේ දවසේ කුමන කාලයේ ද?

.....................................................................................................................

3. ලස්සන යන පදයට සමානාර්ථ පදයක් ලියන්න.

.....................................................................................................................

4. ඡේදයේ සඳහන් ස්ත්‍රීලිංග ඒකවචන ක්‍රියා පදයක් ලියන්න.

.....................................................................................................................

5. ඡේදයේ සඳහන් සඤ්ඤක අකුරක් යෙදුණු වචනයක් ලියන්න.

.....................................................................................................................

6. දරුවා යන්නට යෙදෙන ස්ත්‍රීලිංග පදය ලියන්න.

.....................................................................................................................

12)දසුන් යාළුවොත් එක්ක මිදුලේ සෙල්ලම් කරමින් සිටියා. පුතා යාළුවොත් එක්කා මෙහෙට එන්න දසුන්ගේ අම්මා කතා කළා. දසුන් යාළුවොත් එක්ක ගේ ඇතුළට ආවා. අම්මා රූපවාහිනිය බලනවා. රූපවාහිනියේ උත්සවයක් පෙන්වනවා. හමුදා පෙළපාළි, යුද්ධ ටැංකි, අහසේ කරණම් ගසන ගුවන් යානා, පැරෂුට්, භටයෝ තවත් බොහෝ දේවල් රූපවාහිනිය මත දිග හැරෙනවා.

1. දසුන් සෙල්ලම් කරමින් සිටියේ කොහේ ද? ..........................................................
2. දසුන්ට ගෙට ඒමට කතා කළේ කවු ද? ..........................................................
3. දසුන් ගෙට ආවේ කවුරුන් සමඟ ද? ..........................................................
4. රූපවාහිනියේ පෙන්වූයේ කුමක් ද? ..........................................................
5. අහසේ කරණම් ගැසුවේ මොනවා ද? ..........................................................

13) යාළුවෝ හතර දෙනාගේ සැපදුක් දැන ගන්න දවසක් පිනුම් හාමි ඒගොල්ලන්ගේ ගෙදරට ආවා. යාළුවෝ හතරදෙනා පිනුම් හාමි දැකලා බොහෝම සන්තෝස වුණා. රූං රූං පැන්වා පිනුම් හාමිට අත් මේස් කුට්ටමක් ගොතලා දුන්නා. බක බක අප්පුහාමි ලොකු කැරට් අලයක් දුන්නා. ඉඳිකටු මුදියන්සේ ඇපල් ගෙඩියක් දුන්නා. හඬලන රාල රස කැවිලියි, පාන් ගෙඩියකුයි දුන්නා.

1. යාළුවෝ හතර දෙනාගේ සැපදුක් දැන ගන්න ආවේ කවු ද? ..................................
2. පිනුම් අප්පුහාමි දැක බොහොම සන්තෝස වුණේ කවු ද?......................................
3. පිනුම් අප්පුහාමිට අත් මේස් කුට්ටමක් ගොතලා දුන්නේ කවු ද? ............................
4. බක බක අප්පුහාමි පිනුම් හාමිට දුන්නේ මොනවා ද? ..........................................
5. පිනුම් හාමිට ඇපල් ගෙඩියක් දුන්නේ කවු ද? ..................................................
6. හඬලන රාල පිනුම් හාමිට දුන්නේ මොනවා ද? ..................................................

14)කවිඳු සෑම සෙනසුරාදා දිනක ම සවස නිවස අසල ඇති පිට්ටනියට යයි. ඒ පිට්ටනිය වටා අඹ, පේර, ජම්බු, රඹුටන් ගස් ඇත. ඒවා පිට්ටනිය වටා ඇති ආරක්ෂක පවුරක් සේ පෙනෙයි. කුරුල්ලන්, වඳුරන්, ලේනුන් ඒ පලතුරු ගස්වල නිරන්තරයෙන් ම සිටිනුයේ ඉදුණු අඹ, පේර, ජම්බු, රඹුටන් කෑමට ය. සවස තුන පමණ වන විට අරිත, උතුළ, මාලික් සහ ආදවන් ද පිට්ටනියට එති. සියලු දෙනා ම සමගියෙන් ඔට්ටු සෙල්ලම් කරති. බට්ටා පනිති. ක්‍රිකට් ගසති.

1. මෙහි සඳහන් සියලු දෙනා ම එකතු වන්නේ කුමන ස්ථානයකට ද?

   .........................................................................................................

2. ඡේදයේ සඳහන් උපමාව තෝරා ලියන්න.

   .........................................................................................................

3. ඡේදයේ සඳහන් නාම විශේෂණ පදයක් තෝරා ලියන්න.

..................................................................................................................

4. වර්තමාන කාල ඒකවචන ක්‍රියා පදයක් තෝරා ලියන්න.

..................................................................................................................

5. ප්‍රථම පුරුෂ බහුවචන නාම පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

..................................................................................................................

6. පාපිලි දෙකක් යෙදී ඇති වචනයක් තෝරා ලියන්න.

..................................................................................................................

15) වේගයෙන් පැමිණි මුහුදු රැල්ලක් ගල් කුළක හැපීමෙන් සුදු පෙණ කැට විසිරී ගියේ ය. සීතල දිය බිඳු ඇගේ වැදුණි. යහළුවෝ වෙරළේ වාඩි වී වැලි මාලිගා සෑදූහ. එක් යහළුවෙක් ලස්සන ම ලස්සන සිප්පිකටුවලින් මාලිගා සැරසුවේ ය. ඈත මුහුදේ නැවක් නැංගුරම් ලා තිබුණි. ධීවර බෝට්ටු වෙරළේ තැනින් තැන නවතා ඇත. දැල් ආම්පන්න තව තැනක ගොඩ ගසා ඇත. වෙළෙන්දෝ මාළු තෝරති. ලොකු ම ලොකු මාළු කූරියෙක් රිදී පාටින් දිලිසෙයි.

ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරාගෙන තිත් ඉරි මත ලියන්න.

1. යහළුවෝ වෙරළේ වාඩි වී කළේ කුමක් ද?

..................................................................................................................

2. විශාල ම යන අදහස ඡේදයේ දැක්වෙන්නේ කෙසේ ද?

..................................................................................................................

3. ප්‍රාණවාචී ඒක වචන අතීත කාල වාක්‍යයක් තෝරා ලියන්න.

..................................................................................................................

4. ප්‍රාණවාචී බහු වචන උක්ත පදයක් ලියන්න.

..................................................................................................................

5. "අලංකාර" යන්නට සමාන පදයක් ලියන්න.

..................................................................................................................

6. නැව නැංගුරම්ලා තිබුණේ කොහේ ද?

..................................................................................................................

16)වයස අවුරුදු තුනේ දී හදිසි අනතුරකින් සදහට ම දෘශ්‍යාබාධිත තත්ත්වයට පත් වූ පුංචි ලුයීට දිනෙන් දින මුහුණ පාන්නට සිදු වූ අභියෝග රැසකි. ඒ අභියෝග ජය ගනිමින් දෙනෙතින් නො ව සවනින් ලෝකය හඳුනාගත් ඔහු ලුයී බ්‍රේල් ය. දෘශ්‍යාබාධිත පුද්ගලයන් භාවිතා කරන කියවීමේ හා ලිවීමේ ක්‍රමය වන 'බ්‍රේල් ක්‍රමය' සොයා ගත් ඔහු ප්‍රංශ ජාතිකයෙකි.

ඔහුගේ චරිතය ඇසුරෙන් මාග්‍රට් ඩේවිඩ්සන් රචනා කළ 'ලුයී බ්‍රේල්' කෘතිය එඩ්නා මල්කාන්ති මහත්මිය විසින් සිංහලට පරිවර්තනය කර තිබේ.

1. ඡේදයෙන් විස්තර වන්නේ කවුරුන් පිළිබඳව ද?

   .................................................................................................................

2. ඔහු කුමන ජාතිකයෙක් ද?

   .................................................................................................................

3. බ්‍රේල් ක්‍රමය යනු කුමක් ද?

   .................................................................................................................

4. ඔහු ලෝකය හඳුනාගත්තේ කෙසේ ද?

   .................................................................................................................

5. 'පෙනීමේ දුබලතා සහිතව' යන අදහස දෙන පදය ඡේදයෙන් තෝරා ලියන්න.

   .................................................................................................................

6. ගැට ඇලපිල්ල සහිත වචනයක් දෙවන ඡේදයෙන් තෝරා ලියන්න.

   .................................................................................................................

17)කැලයේ අප සිත් ගත් එක තැනක් වූයේ දිය ඇල්ලයි. කන්ද මැද්දේ රත්තණ පඳුරක් අස්සෙන් මතුවන පුංචි දිය කඳුරක් වේගයෙන් පහළට ගලා බසියි. වතුර ගලන්නේත් පහත් තැනකට යයි පෙන්වන ලෙසින් තවත් දිය කඳුරු කීපයක් ඊට ම එක්වෙයි. එහෙයින් ටික දුරක් යන්නට පෙර සෑහෙන දිය කඳක් ගලා බසියි. මේ දියකඳ එක් තැනකදී ගල් තලාවකින් පහළට ඇද හැලී අපූරු දිය ඇල්ලක් මවයි.

1. කැලයේ සිත් ගත් තැන වූයේ කුමන ස්ථානය ද?

   .................................................................................................................

2. ඉහළට යන්නට විරුද්ධ අර්ථය දැක්වෙන පදය ලියන්න.

   .................................................................................................................

3. රත්තණ පඳුරක් අස්සෙන් මතු වූයේ කුමක් ද?

   .................................................................................................................

4. "ස්වල්පය" යන අර්ථය දීමට ඡේදයේ සඳහන් පදය කුමක් ද?

.................................................................................................................

5. ඡේදයේ සඳහන් පරිදි අපූරු දිය ඇල්ලක් නිර්මාණය වන්නේ කෙසේ ද?

.................................................................................................................

6. කන්ද යන වචනයෙහි බහුවචන අර්ථය ලියන්න.

.................................................................................................................

18) "වැස්ස නැති හැමදාක ම ලොකු අම්මා පොල් ලෙලි තැළීමට ගියා. තළන ලද ලෙලි, කොහු වුණාට පසු ලොකු අම්මා ඒවා ගෙනැවිත් මිදුලේ දමා වේලා ගත්තා. වේළුණු කොහු නෙළීමෙන් ඈ හදා ගත්තේ මිදුල මැද රන්වන් කොහු වලාකුළක්. ඒ වලාකුළේ මා පෙරළි පෙරළි සෙල්ලම් කළේ පූසි පැටවකු මෙන් නිදහසේ. වෙලාවකට මට හිතුණා ඒ රන්වන් කොහු, යෝධ සීයා කෙනෙකුගේ රැවුළක් දෝ කියලා."

**සිබිල් වෙත්තසිංහ**

**වැනියං කළු වැනියං කෘතිය ඇසුරෙනි.**

- ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරාගෙන තිත් ඉරි මත ලියන්න.

1. වැස්ස නැති හැමදාක ම ලොකු අම්මා ගියේ කොහේ ද?

.................................................................................................................

2. වේළුණු කොහු නෙළීමෙන් ඈ මිදුල මැද සාදා ගත්තේ කුමක් ද?

.................................................................................................................

3. මෙහි කියැවෙන උපමාව කුමක් ද?

.................................................................................................................

4. තලණ ලද ලෙලි, කොහු වුණාට පසු ලොකු අම්මා කළේ කුමක් ද?

.................................................................................................................

5. මූර්ධජ "ළ" අකුරට පාපිල්ල යෙදුණු වචනයක් ලියන්න.

.................................................................................................................

6. ස්ත්‍රී ලිංග ඒකවචන නාම පදයක් ලියන්න.

.................................................................................................................

19)අප ගෙනා කෑම ඉවර වන්නට ළං වූයෙන් අපි පසු දා ඔරුව බාගෙන එගොඩට යාත්‍රා කළෙමු. අප විසින් වේළන ලද අඹවලින් ද එකතු කරන ලද කජු ඇටවලින් ද කොටස බැගින් අපි පොඩි ගමරාළට දුන්නෙමු. ඔහු ගත්තේ වියළි අඹ ටිකක් පමණි. අනික් අඹත්, කජුත් කඩපළට ගෙන ගොස් විකුණා හාල් හා මිරිස් ලුණු ආදිය ගත්තෙමු. මා තන්ගුස් දෙපටක් ද අස්ව කෙඳි ටිකක් හා බිළී කටු ද මිලට ගත්තේ මාළු බානු පිණිස ය. අපි පොඩි ගමරාළගේ ගෙදරින් දවල් බත් කා හවස් වරුවේ යළිත් මඩොල් දූව බලා යාත්‍රා කළෙමු.

මඩොල් දූව
මාර්ටින් වික්‍රමසිංහ

- පහත දැක්වෙන ප්‍රශ්නවලට ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

1. ඔරුව එගොඩට යාත්‍රා කරවීමට සිදුවූයේ ඇයි?

   ..............................................................................................................

2. පොඩි ගමරාළට දුන්නේ මොනවා ද?

   ..............................................................................................................

3. මොවුන් වෙළෙඳ පොළට ගොස් ආහාර පිසීමට මිලදී ගත් ද්‍රව්‍ය දෙවර්ගයක නම් ලියන්න.

   ..............................................................................................................

4. උත්තම පුරුෂ බහුවචන අතීත කාල ක්‍රියා පදයක් සොයා ලියන්න.

   ..............................................................................................................

5. මෙම ඡේදය උපුටාගත් පොතෙහි කතුවරයා කවු ද?

   ..............................................................................................................

6. "අපි මඩොල් දූව බලා යාත්‍රා කළෙමු." මෙම වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

   ..............................................................................................................

20)අපි හතර පැයක් පමණ යාත්‍රා කොට දූපතේ දකුණු පැත්තට ළඟා වීමු. මේ වර අපි ඔරුව නැවැත්වූයේ පළමු දෙවාරයෙහි ම නැවැත්වූ තැනට වඩා හොඳ තැනක ය. ගල්කුළු කිහිපයක් ඇති ඒ ගං ඉවුර මඩවලක් නොවීය. දිග බොරු කකුල් රාශියක් වැනි මුල් වලින් නැගී සිටි කඩොල් ගස් පෙළ දූපත වටා යාමට තනන ලද පාලමක් වැන්න. අපි ඔරුවෙන් බැස ඔරුවේ තිබුණු සියලු දේ ගෙන ඔරුව ද ගොඩට ඇද්දෙමු. ඉවුරට මදක් ඈතින් තිබුණු ලී කොට තුනක් පෙරළා තබා එහි ගල් දමා තළා තොටුපළක් ද සෑදුවෙමු.

1. ඔවුන් යාත්‍රා කළේ කොහේට ද?

   ..............................................................................................................

2. මීට පෙර කී වතාවක් මෙහි පැමිණ තිබුණේ ද?

.......................................................................................................

3. මෙහි ඇති රකාරාංශය සහිත වචනය වටා රවුමක් අඳින්න.

.......................................................................................................

4. ඔරුව නැවැත්වීමට සෑදූ ස්ථානය කුමක් ද?

.......................................................................................................

5. ජලය ආශ්‍රිත වගුරු බිම්වල සෑදෙන ශාකයක් මෙහි කියවේ. එය කුමක් ද?

.......................................................................................................

6. "අපි තොටුපළක් සෑදුවෙමු" මෙම වගන්තිය ඒක වචනයට හරවා ලියන්න.

.......................................................................................................

21) තිත් මුවෝ කීප දෙනෙක් ඉදිරියට ආහ. ඔවුන් ගමන් ගත්තේ යාන්තමින් පොළොවට පා තබන්නාක් මෙන් ඉතා නිසලව ය. අං තට්ටු කීපයක් දැරූ ලොකු මුවෙක් වැව ඉවුරේ සිට ගෙන, දෙකන් ඒ මේ අතර හරවමින් උදාර ලීලාවෙන් බලා සිටියේ ය. ඌ රැළේ නායකයා වන්නට ඇත. ඌ එසේ සිටිද්දී සෙස්සෝ වැවට බැස දිය බොන්නට වූහ. මුව දෙනක් කුඩා පැටවකුත් සමඟ දියට බැස්සා ය. අනතුරුව, මෙතෙක් වේලා ගොඩ සිටි මුවා ද වැවට බැස්සේ ය.

වනගත ළමෝ

මෙම ප්‍රශ්නවලට ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

1. තිත් මුවෝ ගමන් කළ ආකාරය ඡේදයේ දක්වා ඇත්තේ කෙසේ ද?

.......................................................................................................

2. වැව ඉවුරේ සිටගෙන සිටියේ කවු ද?

.......................................................................................................

3. ඡේදයේ සඳහන් වන ස්ත්‍රීලිංග නාම පදයක් සොයා ලියන්න.

.......................................................................................................

4. 'ප්‍රතාපවත් විලාසයෙන්' යන අදහස ගෙන දෙන යෙදුම ඡේදයෙන් උපුටා ලියන්න.

.......................................................................................................

5. දික් ඇද පාපිල්ල සහිත වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

.......................................................................................................

22)මුදු වෙරළේ සෙල්ලම් කිරීමට ළමයි ඉතා ආශා ඇත්තෝ ය. සමහර ළමයි රළ පාගමින් වෙරළේ ඔබ මොබ දුවති. වෙරළට ළංව බිඳ වැටෙන රළයක් වේගයෙන් ගොඩට දිවෙයි. රළ පාගමින් සිටින ළමයි ද රළයට අසු වී ඇඳුම් තෙමෙතැයි බයෙන් වහ වහා වෙරළට දුවති. රළය බිඳ වැටීමෙන් ගලන වතුරෙන් කොටසක් තීන්ත පොවන කඩදාසියක් තීන්ත උරාගන්නාක් මෙන්, බුරුල් පස් අතරින් පොළොව උරා ගනියි. ඉතුරු වන වතුර වහ වහා ආපසු මුදට ම ඇදී යයි. ළමයි ද ප්‍රීතියෙන් බැස යන වතුර පාගමින් දුවති.

1. ළමයි ඉතා ආශා කරන්නේ කුමකට ද? ..............................................................
2. ළමයි වහ වහා වෙරළට දුවන්නේ ඇයි? ..............................................................
3. ඡේදයේ සඳහන් යුගල පදය ලියන්න. ..............................................................
4. ඡේදයේ සඳහන් උපමාව ලියන්න.

   ..............................................................................................................
5. 'සතුටින්' යන අර්ථය දෙන වචනය සොයා ලියන්න. ...............................................
6. 'ඹ' ශබ්දය දෙවරක් යෙදී ඇති තනි වචනයක් සොයා ලියන්න. ...............................
7. රකාරාංශය යෙදුණු වචනයක් සොයා ලියන්න. ....................................................
   'සවිමත් නොවන' යන අදහස දෙන පදය ලියන්න. ................................................

23)"අතීතයේ අප රට වැසියෝ මඟුල් ගෙවල්වල රබන් වයා විනෝද වූහ. සිංහල අවුරුදු කාලයට රබන් වයමින් නැටූහ. අතීතයේ ආගමික උත්සවවල දී ද රබන් වැයූ බව අප අසා තිබේ." මේ සඳහා භාවිත කරන ලද්දේ මහ රබාන හෙවත් බංකු රබානයි. රබාන 'එකැස් බෙරය' නමින් ද හඳුන්වා තිබේ.

1. ඡේදයට අනුව අපේ රට වැසියෝ මඟුල් ගෙවල්වල විනෝද වූයේ කෙසේ ද?

   ..............................................................................................................
2. ඔවුහු සිංහල අවුරුදු කාලයට කළේ කුමක් ද?

   ..............................................................................................................
3. මහ රබාන හඳුන්වන වෙනත් නමක් ලියන්න.

   ..............................................................................................................
4. ප්‍රාණවාචී බහුවචන පුද්ගල නාමපදයක් සොයා ලියන්න.

   ..............................................................................................................
5. ඡේදයේ සඳහන් අතීතකාල බහු වචන ක්‍රියාපද දෙකක් සොයා ලියන්න.

   ..............................................................................................................
6. කෙටි කොන් පාපිල්ල සහිත අකුරක් යෙදී ඇති වචනයක් ලියන්න.

   ..............................................................................................................

24)වරුණි තැනින් තැන තිබුණු සිප්පි කටු, කවඩි එකතු කරගත්තා. මනුකයි, තරිඳුයි වෙරළේ වාඩිවෙලා වැලි මාලාගාවක් හැදුවා. වරුණි ලස්සන ම ලස්සන සිප්පි කටුවලින් මාලිගාව සැරසුවා. හැමෝම ඒ දිහා බලාගෙන හිටියා. ගුරුතුමිය කැමරාවෙන් පින්තූරයක් ගත්තා. සරුංගලයක් ඈත අහසේ පා වෙනවා. ඒ දිහා බලාගෙන සමහරු විනෝද වුණා.

**ඡේදය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ඡේදයෙන් විස්තර වන්නේ කුමන ස්ථානයක් පිළිබඳව ද? .......................................
2. වරුණි එකතු කළේ මොනවා ද? .............................................................................
3. වැලි මාලිගාවක් සෑදුවේ කවු ද? ..........................................................................
4. වරුණි සිප්පි කටුවලින් කළේ කුමක් ද? ................................................................
5. 'කවඩි' ඉරි ඇඳි අකුරට යෙදී ඇති පිල්ලම කුමක් ද? ..............................................
6. 'ගුරුතුමා' යන පදයේ ස්ත්‍රීලිංග පදය ලියන්න. ......................................................

25)සරුවට වැඩී නිල් පැහැයෙන් ශෝභමාන වූ කෙත කහ පැහයට හැරෙන්නට පටන් ගත්තේ ගොවියන්ගේ දෙනෙතෙහි රසඳුන් ගන්නා සේ ය. දෑකැති සිහිපත් කර වූ රන්වන් කරල් බිමට නැමුණේ ගොවියන්ගේ දහදිය උරුමය කැටි කර ගෙන ය. වසුළු රන් දහදිය බිඳු මිදි කරල් දෙපස ඇමිනුණේ වී ඇට බවට පත් කරමින් ය.

**ඡේදය ඇසුරින් පහත ප්‍රශ්නවලට ළිතුරු සපයන්න.**

1. ඡේදයේ විස්තර වන්නේ කුමන පරිසරයක් පිළිබඳව ද?

   .................................................................................................................
2. කෙත කහ පැහැයට හැරෙන්නට පටන් ගත්තේ කුමක් සේ ද?

   .................................................................................................................
3. බිමට නැමුණේ මොනවා ද?

   .................................................................................................................
4. 'කුඹුර' යන පදයට සමානාර්ථ පදය කුමක් ද?

   .................................................................................................................
5. අප්‍රාණවාචී බහුවචන නාම පදයක් ලියන්න.

   .................................................................................................................
6. 'ඕ' යන ශබ්දය යෙදුණු වචනයක් ලියන්න.

   .................................................................................................................

26)සේවය ම සිය 'රජකාරිය' කර ගත් මේ අපූරු අත්තම්මා වයස අවුරුදු අසූව ඉක්මවා තිබියදීත් විශ්‍රාම නොගත්තා ය. පුරා අවුරුදු හතළිහකට වැඩි කාලයක් ඇය එක දිගට දරුවන් වෙනුවෙන් කැප වූ මුත් මේ අත්තම්මාගේ රාජකාරියට මාසික වැටුප් නැත. කිසිදු දීමනාවක් නැත. පාසල පැවැත්වෙන සෑම දවසක ම ඈ සුපුරුදු රාජකාරියේ ය. ප්‍රමාද වී පැමිණීම් හෝ කෙටි නිවාඩු ද නැත. උදේ හයේ සිට නවයයි තිහ වන තෙක් ද, දහවල් දොළහේ සිට සවස තුනයි තිහ වන තෙක් ද තමා ම සකසා ගත් කාලසටහනකට අනුව ඈ දිනපතා සේවයේ නියැලෙන්නී ය. අමතර සවස පන්ති හෝ ක්‍රීඩා පුහුණුවීම් ආදිය පැවැත්වෙද්දී සවස පහ වන තුරු ඈ පාසලේ ගේට්ටුව ළඟ ය.

**ඡේදය ඇසුරෙන් පමණක් පිළිතුරු සපයන්න.**

1. සේවය ම සිය රාජකාරිය පමණක් කර ගත්තේ කවු ද? ........................................
2. ස්ත්‍රී ලිංග ඒකවචන අතීත කාල ආඛ්‍යාත පදයක් ලියන්න. ....................................
3. 'දෛනික' යන්න සමාන අදහස ඇති පදයක් ඡේදයෙන් සොයා ලියන්න.

   ..............................................
4. 'දුර' යන්නට විරුද්ධාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ................................
5. තාලුජ අක්ෂරයක් සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. ...............................

27)පාසලටත් අපේ ගෙදරටත් අතර එක් තැනක පාළු අම්බලමක් වෙයි. ළමයි, තාප්පයකින් වටවුණු ඒ ඉඩමේ පොල් ගස් හතරේ හට ගන්නා කුරුම්බා කඩාගෙන කති. අම්බලම වත්තේ කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා ජින්නා ය. ඊළඟ නායකයා මම ය. ජිනපාල ගසට නැග කුරුම්බා කඩා බිම දමනවිට, ඒ කුරුම්බා අවුලා ගෙනැවිත් ළමයින්ට බෙදා දෙන්නේ මා විසිනි. පාසලෙහි සිට ගෙදර ආ විගස පොත් හා ගල් ලෑලිත් මේසයක් උඩ හෝ ඇඳක් උඩ හෝ දමා මා දුවන්නේ තවත් ළමයින් තුන් හතර දෙනෙකු සමඟකෙළි සෙල්ලම් කරනු පිණිස ය. ජිනපාල ද මා සමඟ එයි. ඔහු මා පාසලෙන් එන තෙක් බලා සිටින්නේ ද මා සමඟ සෙල්ලම් කිරීමට දුවනු පිණිස ය.

1. පාසලටත් ගෙදරටත් අතර තිබෙන්නේ කුමක් ද?

   ..........................................................................................................
2. කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා වන්නේ කවරෙක් ද?

   ..........................................................................................................
3. ඡේදයේ ඇති යුගල පදයක් තෝරා ලියන්න.

   ..........................................................................................................
4. පාසලෙන් එන තෙක් මග බලා සිටින්නේ කවු ද?

   ..........................................................................................................

5. වර්තමාන කාල බහුවචන ක්‍රියාපදයක් තෝරා ලියන්න.

..............................................................................................................

6. ඇලපිලි 2 ක් පමණක් යෙදී ඇති වචනයක් තෝරා ලියන්න.

..............................................................................................................

28)මම පාර්සි නෞකාවේ බරාඳයට නැඹුරු ව, ඉමක් කොනක් නැති මහ සයුරේ සන්සුන් ව ඉහළට පහළට පාවෙන කුඩා සිප්පිය දෙස බලා උන්නෙමි. සුක්කානම හසුරුවන ආකාරයට කුඩා සිප්පිය ද උස් පහත් වේ. කපිතාන්වරයා වරින්වර දුරදක්නයෙන් හාත්පස නැරඹී ය. සැබැවින් ම ඔහු කුතුහලයෙන් යුතු ව චමත්කාරජනක විශ්වය මහත් ඕනෑකමින් නරඹයි.

**ඡේදය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. නෞකාවේ නම කුමක් ද? ..............................................................................
2. දුරදක්නයෙන් හාත්පස නැරඹූයේ කවුරුන් ද? ...................................................
3. සුක්කානම හසුරුවන ආකාරයට උස් පහත් වූයේ කුමක් ද? ..................................
4. 'අපි' යන පදයේ ඒක වචන පදය ලියන්න. ........................................................
5. 'මුහුදේ' යන පදයට සමාන අදහස දෙන පදය ලියන්න. ......................................
6. පුරුෂ ලිංග ඒක වචන නාම පදයක් ලියන්න. ....................................................

29)කැලයේ අප සිත් ගත් එක තැනක් වූයේ දිය ඇල්ලයි. කන්ද මැද්දේ රත්තණ පඳුරක් අස්සෙන් මතුවන පුංචි දිය කඳුරක් වේගයෙන් පහළට ගලා බසියි. වතුර ගලන්නේත් පහත් තැනකට යයි පෙන්වන ලෙසින් තවත් දිය කඳුරු කීපයක් ඊට ම එක්වෙයි. එහෙයින් ටික දුරක් යන්නට පෙර සෑහෙන දිය කඳක් ගලා බසියි. මේ දිය කඳ එක් තැනක දී ගල් තලාවකින් පහළට ඇද හැලී අපූරු දිය ඇල්ලක් මවයි. ලෙකු ගල් පර්වත රැසක හැපෙන දිය කඳ සුදු පැහැයෙන් රූරා ගොස් ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි. මේ ඇළ නැවත මතුවන්නේ ගම මැදින් ගලා බසිමිනි.

දිය ඇල්ලේ සෝෂාව කැලෑවේ ටික දුරක් පැතිරෙයි. ගල් තලා දෙපස ඕකිඩ්, වෙසක් ආදී මල් ද, කුඩා හැඩයා ආදී පැළෑටි ද වැවී ඇත. කිසිවකු අතින් සාත්තු නොලබන මල් පඳුරු විස්තර කළ නොහැකි අලංකාර මල් හට ගන්වයි.

- **ඡේදය ඇසුරන් අසා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු, දී ඇති තිත් ඉරි මත ම ලියන්න.**

1. කැලයේ සිත් ගත් තැන වූයේ කුමන ස්ථානය ද? ................................................
2. රත්තණ පඳුරක් අස්සෙන් මතු වූයේ කුමක් ද? ...................................................
3. ගල් තලාවකින් ඇද හැලෙන දිය කඳ හඳුන්වන්නේ කුමන නමකින් ද?

..............................................................................................................

4. ගල් පර්වත රැසක හැපෙන දිය කඳ කුමන පැහැයෙන් යුතු ද? ..............................

5. ගල්තලා දෙපස වැවී ඇත්තේ මොනවා ද? ..............................

30) තාත්තා ප්‍රවේශපත් මිලදී ගත්තේ ය. දුම්රිය කාල සටහන ද කියවා බැලුවේ ය. අපි ගමන් මලු රැගෙන යන බදුලු දුම්රිය නවත්වන වේදිකාවට ගියෙමු.
ශබ්ද විකාශන යන්ත්‍රයෙන් වරින් වර දුම්රිය ගමන් තොරතුරු නිවේදනය විය.

**ඡේදය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ප්‍රවේශපත් මිලදී ගත්තේ කවු ද? ..............................
2. ගමන් මලු රැගෙන ගියේ කුමන දුම්රිය වේදිකාවට ද? ..............................
3. දුම්රිය ගමන් තොරතුරු නිවේදනය කළේ කුමකින් ද? ..............................
4. 'අම්මා' යන පදයේ පුරුෂලිංග නාම පදය ලියන්න. ..............................
5. 'මම' යන පදයේ බහුවචන පදය ලියන්න. ..............................
6. 'ප්‍රවේශපත්' ඉරි ඇඳි අකුර හඳුන්වන්න. ..............................

31) 2000 වර්ෂයේ සිට සෑම වර්ෂයක ම පෙබරවාරි මස 21 වන දින ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය ලෙස සැමරීම සිදු කරනු ලැබේ. මේ වන විට ලෝකයේ රටවල් 188 ක් ජාත්‍යන්තර භාෂා දිනය සමරයි. ලොව වැඩි ම පිරිසක් භාවිත කරන භාෂාව චීන භාෂාව වන අතර දෙවන ස්ථානය හිමි වන්නේ ස්පාඤ්ඤ භාෂාවටයි. ඉංග්‍රීසි භාෂාවට තෙවන ස්ථානය හිමි වන අතර සිංහල භාෂාවට 62 වන ස්ථානය හිමි වෙයි.

**පහත ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන හිස් තැන මත ලියන්න.**

1. ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය සමරනු ලබන්නේ කවදා ද?
   ..............................
2. ලොව වැඩි ම පිරිසක් භාවිතා කරන භාෂාව කුමක් ද?
   ..............................
3. සිංහල භාෂාවට හිමි ව ඇත්තේ කී වෙනි ස්ථානය ද?
   ..............................
4. මාතෘ භාෂා දිනය ආරම්භ වූයේ කුමන වර්ෂයේ සිට ද?
   ..............................
5. මෙහි සඳහන් පරිදි තෙවන ස්ථානය හිමි ව ඇත්තේ කුමන භාෂාවට ද?
   ..............................
6. 'මව' යන්නට සමාන වචනයක් තෝරා ලියන්න.
   ..............................

32)ශ්‍රී ලංකාවේ පිහිටි කඳු අතරින් උසින් වැඩි ම කන්ද ලෙස සැලකෙන්නේ පිදුරුතලාගල කන්ද යි. එහි උස මුහුදු මට්ටමේ සිට මීටර 2524 කි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි මෙම කන්දට ගමන් කළ යුත්තේ නුවරඑළිය නගරය හරහා ය. මහවැලි ගඟෙහි අතු ගංගාවක් වන බෙලිහුල් ඔය ආරම්භ වන්නේ ද පිදුරුතලාගල කඳු පන්තිය ආශ්‍රිතව යි. පිදුරුතලාගල කන්ද සමීප වනාන්තරයේ දැකිය හැකි ශාක හා සතුන් අතරින් වැඩි ප්‍රමාණයක් අපේ රටට ආවේණික වෙති. දිය ඇලි රැසකින් හැඩ වී ඇති මෙම කන්ද ජේද්‍රෝ කන්ද යනුවෙන් ද හැඳින් වේ.

1. ශ්‍රී ලංකාවේ පිහිටි කඳු අතරින් උසිස් වැඩි ම කන්ද වන්නේ කුමක් ද?

   ..........................................................................................................

2. පිදුරුතලාගල කන්ද පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?

   ..........................................................................................................

3. ජේද්‍රෝ කන්ද නමින් හඳුන්වන කන්ද කුමක් ද?

   ..........................................................................................................

4. පිදුරුතලාගල කඳු පන්තියෙන් ආරම්භ වන මහවැලි ගඟෙහි අතු ගංගාව කුමක් ද?

   ..........................................................................................................

5. මෙම කන්ද හැඩ වී ඇත්තේ මොනවායින් ද?

   ..........................................................................................................

6. ඉස්පිලි 3 ක් පමණක් යෙදී ඇති වචනයක් තෝරා ලියන්න.

   ..........................................................................................................

33)'අපි ම අරඹමු - ඩෙංගු දුරලමු' යන තේමාව යටතේ සිසුන් දෙමව්පියන් සහ ගුරුවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පසුගියදා පාසලේ දී පැවැත්විණ. පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය මෙම වැඩසටහනට මුලිකත්වය ගත්තේ ය.

1. මෙම වැඩසටහනෙන් දැනුවත් කරන්නේ කවුරුන් ව ද?

   ..........................................................................................................

2. මෙහි මූලිකත්වය ගනු ලබන අමාත්‍යාංශය කුමක් ද?

   ..........................................................................................................

3. වැඩසටහන පැවැත්වූයේ කොහේ ද?

   ..........................................................................................................

4. විදේශීය යන වචනයට විරුද්ධාර්ථ වචනය ජේදයෙන් තෝරා ලියන්න.

   ..........................................................................................................

5. මෙම දැනුවත් කිරීමේ වැඩසටහනේ තේමාව කුමක් ද?

   ..........................................................................................................

6. අතීත කාල ඒක වචන ක්‍රියා පදයක් තෝරා ලියන්න.

   ..........................................................................................................

34) පරාක්‍රම මහා විද්‍යාලයේ පස් වන ශ්‍රේණියේ සිසු - සිසුවියන්ගේ චිත්‍ර හා පෝස්ටර් ප්‍රදර්ශනයක් වර්ෂාවසානයේ දී පැවැත්වීමට සූදානම් කර තිබුණි. ඒ අනුව පාසලේ සෑම සිසුවෙකුගේ ම චිත්‍රයක් ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී.

එම ප්‍රදර්ශනයේ දී පැන්සල භාවිත කර පසන් විසින් අඳින ලද පාසිකුඩා වෙරළ දැක්වෙන චිත්‍රයට ප්‍රථම ස්ථානය ද, පෑන භාවිත කර පින්සර විසින් අඳින ලද චිත්‍රය දෙවන ස්ථානය ද හිමි කර ගත්තේ ය.

1. පැන්සලෙන් කළ නිර්මාණය කුමක් ද? ..........................................................................
2. පින්සර විසින් අඳින ලද චිත්‍රයට ලැබුණේ කුමන ස්ථානය ද?
   ..........................................................................................................................
3. මෙම චිත්‍ර හා පෝස්ටර් ප්‍රදර්ශනය පැවැත්වීමට සූදානම් කර තිබුණේ කවදා ද?
   ..........................................................................................................................
4. මෙහි මහාප්‍රාණ අක්ෂරයක් දෙවැනි අකුර ලෙස ලැබුණු වචනයක් ලියන්න.
   ..........................................................................................................................
5. මෙම චිත්‍ර හා පෝස්ටර් ප්‍රදර්ශනයට සහභාගී වූයේ කවු ද?
   ..........................................................................................................................
6. මෙහි **'විදුහලේ'** යන්නට දී ඇති සමාන පදය ලියන්න. ..........................................

35) ඔවුන් වඩාත් ම සතුටු වන්නේ තම අස්වැන්න හොඳ මිලකට වෙළඳාම් කර ගැනීමට හැකි වූ විට ය. හේන් ගොවිතැන වෘත්තිය කර ගත් ඔවුන් බොහෝ විට වේදනා විඳින්නේ වන සතුන්ගෙන් වන විනාශ වූ විට ය.

වන සතුන් ද වටිනා සම්පතකි. වන සතුන්ගෙන් බෝග ආරක්ෂා කිරීමට කටයුතු කරන්නේ නම්, සතුන් කෙරෙහි මිනිසුන්ට ඇති වන වෛරය අවම කර ගත හැකි වේ. එයින් වන සතුන් ද ආරක්ෂා වේ.

1. හේන් ගොවිතැන් කරන්නන් වඩාත් සතුටු වන්නේ කුමන අවස්ථාවක ද?
   ..........................................................................................................................
2. හේන් වගා විනාශ කරන්නේ කවුරුන් ද?
   ..........................................................................................................................
3. සතුන් කෙරෙහි මිනිසුන්ට ඇති වන වෛරය අවම කර ගත හැක්කේ කෙසේ ද?
   ..........................................................................................................................
4. කොම්බු දෙක යෙදුණු වචනයක් ලියන්න.
   ..........................................................................................................................
5. 'ඍ' ශබ්දය යෙදුණු වචනයක් ලියන්න.
   ..........................................................................................................................
6. 'අසතුටු' යන පදයේ විරුද්ධාර්ථ පදය ලියන්න.
   ..........................................................................................................................

36)අප පාසල් ඩෙංගු මර්දන දිනය යෙදී ඇත්තේ මැයි මස 05 වන දිනට ය. දෙමව්පියන්ගේ සහභාගිත්වයෙන් ඩෙංගු මර්දන වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කෙරේ. එනදි උදේ 8.30 වන විට දෙමව්පියන් පාසලට පැමිණිය යුතු ය. එසේ පැමිණෙන් විට උදැල්ලක්/ විසි කැත්තක්/ පිහියක් වැනි උපකරණයක් රැගෙන ආ යුතු ය. එනදි පැමිණෙන සියලු දෙනාට සංග්‍රහ කටයුතු සිදු කරනු ලබන්නේ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසිනි.

**නිවේදනය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ඩෙංගු මර්දන දිනය යෙදී ඇත්තේ කවදා ද?

   ..............................................................................................................

2. ඩෙංගු මර්දන වැඩසටහන පැවැත්වෙන්නේ කාගේ සහභාගිත්වයෙන් ද?

   ..............................................................................................................

3. දෙමව්පියන් පාසලට පැමිණිය යුත්තේ කීය වන විට ද?

   ..............................................................................................................

4. සියලු දෙනාට සංග්‍රහ කටයුතු සිදු කරන්නේ කවුරුන් ද?

   ..............................................................................................................

5. 'විදුහල' යන වචනයට සමානාර්ථ පදයක් ලියන්න.

   ..............................................................................................................

6. රකාරාංශය යෙදුණු වචනයක් ලියන්න.

   ..............................................................................................................

37)ගස්වැල් අඹරමින් සුළඟ හැමුවා. අවට අඳුරු වුණා. එකපාරට ම හයියෙන් වහින්න ගත්තා. විදුලි එළි අහසෙ විහිදුණා. මහ හඬින් ගෙරෙවුවා. එළියට බහින්නවත් බැහැ. මාමා ගමේ යන්න පාන්දරම සූදානම් වුණා. "මේ මොර සූරන වැස්සෙ කොහේ යන්න ද" කියලා තාත්තා මාමාගෙන් ඇහුවා.

වැස්ස පෑවුවා ම මාමා ගමේ ගියා. මාත් ඉස්කෝලෙ ගියා.

1. ගස්වැල් අඹරමින් හමා ආවේ කුමක් ද?

   ..............................................................................................................

2. එකපාරට ම සිදු වූයේ කුමක් ද?

   ..............................................................................................................

3. අහසේ විහිදුණේ මොනවා ද?

   ..............................................................................................................

4. මොර සූරන වැස්ස යනු කුමක් ද?

   ..............................................................................................................

5. සඤ්ඤක අකුරක් සහිත වචනයක් ලියන්න. .......................................................

6. පහත ඉරි ඇඳි අකුර හඳුන්වන්න.

   "එළි" - ..........................................................................................

38)සියටැල් නාමය සදාකාලික වීරත්වයෙන් පිදුම් ලබන්නේ පරිසරය සහ සොබා දහම සම්බන්ධයෙන් ඔහුගේ මේ ශ්‍රේෂ්ඨ චින්තනය නිසාම ය. තාක්ෂණයට වඩ වඩාත් සමීප වූ නූතන මිනිසා අද නැවත ගම් දනවු හා වනාන්තර සොයා ඇදෙන්නේ මේ සත්‍යය නැවත අවබෝධ කරගත් නිසා ය. සදාකාලික වීරයෙකු වූ සියටැල් නම් රතු ඉන්දීය නායකයාගේ ඓතිහාසික කතාව ම අදට වැදගත් ය.

1. සියටැල් නාමය සදාකාලික වන්නේ කුමක් නිසා ද?

   ..........................................................................................................

2. මෙහි සඳහන් පරිදි සියටැල් යනු කවුරුන් ද?

   ..........................................................................................................

3. නූතන මිනිසා වඩාත් සමීප වී සිටියේ කුමකට ද?

   ..........................................................................................................

4. "කැලෑ" මෙයට සමාන පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

   ..........................................................................................................

5. "ඉතිහාසයට අයත්" යන්න මෙහි යෙදී ඇති පදය කුමක් ද?

   ..........................................................................................................

6. මූර්ධජ අක්ෂර දෙකක් යෙදුණු වචනය සොයා ලියන්න.

   ..........................................................................................................

39)පාසලටත් අපේ ගෙදරටත් අතර එක් තැනක පාළු අම්බලමකි. ළමයි, තාත්තයකින් වට වුණු ඒ ඉඩමේ පොල් ගස් හතරේ හටගන්නා කුරුම්බා කඩාගෙන කති. අම්බලම වත්තේ කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා වන්නේ ජින්නා ය. ඊළඟ නායකයා මම ය. ජිනපාල ගසට නැග කුරුම්බා කඩා බිම දමන විට, ඒ කුරුම්බා අහුලා ගෙනැවිත් ළමයින්ට දෙන්නේ මා විසිනි. පාසලේ සිට ගෙදර ආ විගස පොත් හා ගල්ලෑලිත් මේසයක් උඩ හෝ ඇඳක් උඩ හෝ දමා මා දුවන්නේ තවත් ළමයින් තුන් හතර දෙනෙකු සමඟ කෙළි සෙල්ලම් කරනු පිණිස ය. ජිනපාල ද මා සමඟ එයි. ඔහු මා පාසලෙන් එන තෙක් මඟ බලා සිටින්නේ ද මා සමඟ සෙල්ලමට දුවනු පිණිස ය.

1. පාසලත් ගෙදරත් අතර තිබෙන්නේ කුමක් ද? ....................................................
2. කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා කවරෙක් ද? ...............................
3. පාසල් ගොස් පැමිණ ළමයින් එක් වී කරන්නේ කුමක් ද?

   ..........................................................................................................

4. කුරුම්බා ළමයින්ට බෙදා දෙන්නේ කවු ද? .......................................................
5. මා පාසල් ගොස් එන තෙක් මඟ බලා සිටින්නේ කවු ද? ...................................
6. කුරුම්බා කඩන්නේ කවු ද? .......................................................................

40)රූකඩ කපන්නාගේ කම්මල වූ කලී කාමරයකින් ද ඉස්තෝප්පුවකින් ද යුතු, මැටි ගසා අතු සෙවෙණි කළ පැල්පතකි. කපා නිම කළ, නොකළ, රූඩකඩින් ද, සායම් ගා වේළීමට තැබූ විචිත්‍ර වර්ණයෙන් ද බබළන රූකඩින් ද, නියන්, කැති, පිහියා, කෙටේරි, සායම් ටින්, බුරුසු, සතුන්ගේ ඇට කටු, දත්, නිය, ඔළිඳ ඇට යන ආදියෙන් ද පිරි ඔහුගේ කම්මලෙහි ඇතුළු කාමරය වූ කලී නියම කටු ගෙයක් විය. ඉස්තෝප්පුවේ කොනක වූ වතුර සැළියක් ගත් ලිග්ගල් තුනකින් යුතු උදුනෙන් දුම් නොනගින්නේ දවල් දොළහේ සිට එක දෙක වන තෙක් පමණි. එතැන් සිට රෑ හත වන තුරු උදුනෙන් නගින ගින්න නොනිවේ. වතුර සැළිය උපකාර වූයේ ඔහුගේ රූකඩ කැපීමට නොව ඔහු රූකඩ කැපීමෙන් එකතු කරගත් සුළු මුදලට තවත් සත කිහිපයක් ලබාදීමෙන් ඔහුගේ ආදායම වැඩි කිරීමට ය. රූකඩ කපන්නාගේ ඉස්තෝප්පුව කෝපි කඩයකි.

1. රූකඩ කපන්නාගේ කම්මලෙහි ඇතුළු කාමරය කටු ගෙයක ස්වරූපය ගන්නේ කුමක් නිසා ද? ..............................................................................................
2. උදුනෙන් දුම් නොනගින්නේ කුමන වේලාවට ද? ..........................................
3. රූකඩ කපන්නාගේ කම්මලෙහි කාමර කීයද? ............................................
4. ඔහුගේ කාමරයේ ඇති දේවල් පහක් ලියන්න. ............................................
   ..............................................................................................
5. රූකඩ කපන්නාගේ ඉස්තෝප්පුවේ ඇත්තේ කුමක් ද? ..................................

ශ්‍රී රුවන් තිළිණ

හෙට දිනවන නැවුම්
බලාපොරොත්තුව.........

**ශ්‍රී රුවන් තිළිණ**

**071 66 84 251**

